# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,705 — 1959 මාර්තු 20 වැනි සිකුරාදා—20.3.1959**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද් දෙනි)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ... | 821 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 821 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 822 |
| වෙනත් පත් කිරීම් ... ... ... | 823 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 823 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 827 |
| "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... | |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම්

**1959 අංක 111**

අ. ආ. කා. අංකය : C 162/49 (II).

පළාත් පාලන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්, වී. සී. ජයසූරිය මහතා දිවයිනට පෙරළා පැමිණෙන තුරු, 1946 යේ හා 1947 තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජ සභා නියෝගවල 51 (1) වැනි වගන්තිය යටතේ, සංස්කෘතික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ, සිවිල් නිලධාරී, ඇන්. ක්‍යූ. ඩයස් මහතා, ස්වකීය රාජකාරිවලට අතිරේකව, 1959 මාර්තු 22 වැනි දින සිට, පළාත් පාලන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තනතුරෙහි වැඩ බැලීමට, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පත්කල බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1959 මාර්තු 17 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍ය්‍යාලය.

---

**1959 අංක 112**

අ. ආ. කා. අංකය : C 162/49 (II).

1946 යේ හා 1947 තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජ සභා නියෝගවල 51 (1) වැනි වගන්තිය යටතේ, කම්කරු කොමසාරිස් සී. බී. කුමාරසිංහ මහතා, ස්වකීය රාජකාරිවලට අතිරේකව, 1959 මාර්තු 17 වැනි දින සිට, කම්කරු, නිවාස හා සමාජසේවා අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තන්තුරෙහි වැඩ බැලීමට, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පත් කල බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1959 මාර්තු 18 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍ය්‍යාලය.

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම්

**1959 අංක 113**

ඒ. 66/59.

පළාත් පාලන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වී. සී. ජයසූරිය මහතා, ස්වකීය රාජකාරිවලට අතිරේක වශයෙන් 1959 මාර්තු මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනු තුරු පළාත් පාලන කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියමකර ඇත්තේය.

ඊ. ජී. ගුණවර්ධන,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1959 මාර්තු මස 17 වෙනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්‍ය්‍යාලය,
තැ. පෙ. 500, කොළඹ 1.

---

**1959 අංක 114**

ඒ. 36/59.

1959යේ ජනවාරි මස 1 වෙනි දින සිට ලංකා සිවිල් සේවාවේ දෙවෙනි පෙළේ පහත නම් සඳහන් නිලධාරීන් පළවෙනි පෙළේ දෙවෙනි ශ්‍රේණියට උසස් කරන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියමකර ඇත්තේය :—

ඒ. ඇස්. කොහොඹන් වික්‍රම මහතා,
ආර්. කුමාරස්වාමි මහතා,
ඩී. ජී. දයාරත්න මහතා,
ඇම්. ජේ. පෙරේරා මහතා,
ජී. ඕ. වීරසිංහ මහතා,
ආර්. ඩී. පී. පවුලස් මහතා,
ජී. බී. ඇස්. ඇන්. පුල්ලෙනායගම් මහතා,
කේ. ඇම්. ඩී. ජයනෙත්ති මහතා,
ඊ. බී. තිස්සවීරසිංහ මහතා,
සී. බාලසිංහම් මහතා,
ඇන්. මානික්ක ඉඩෙයික්කාඩර් මහතා,
ජී. ඊ. ගොගර්ලි මොරගොඩ මහතා,

ඇන්. ජේ. ඇල්. ජැන්ස් මහතා,
ඇම්. ජී. වී. පී. ඩබ්ලිව්. සමරසිංහ මහතා,
ඊ. ජී. ගුණවර්ධන මහතා,
ආර්. ඇල්. ආර්නෝල්ඩා මහතා,
ඒ. ඇම්. ඇස්. පෙරේරා මහතා,
ටී. ඊ. ගුණරත්න මහතා.

ඊ. පී. ගුණවර්ධන,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1959 මාර්තු මස 17 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායර්‍යාලය,
තැ.පෙ. 500, කොළඹ 1.

---

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම්

**1959 අංක 115**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේය.

අංකය: ජේඑස්සී. පීපී. 3/59.

වී. මානිකවාසගර් මහතා 1959 මාර්තු 2 වැනි දින පටන්, නැවත නියමයක් කරන තුරු, මහනුවර දිස්ත්‍රික් නඩුකාර ධුරයේ වැඩ බැලීමට, මහනුවර අතිරේක මහේස්ත්‍රාත් ධුරයේ හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයේ වැඩ බැලීමට.

අංකය: ජේඑම. 2/56.

ජී. ඊ. ආර්. කොරෙයා මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. වෛත්‍යලිංගම් මහතා 1959 මාර්තු 2 වැනි දින පටන්, මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයේ වැඩ බැලීමට, මහනුවර රික්වැස්ට් කොමසාරිස් ධුරයේ හා අතිරේක මහෙස්ත්‍රාත් ධුරයේ වැඩ බැලීමට, මහනුවර අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයේ හා දුම්බර අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයේ හා අතිරේක මහේස්ත්‍රාත් ධුරයේ වැඩ බැලීමට.

අංකය: ජේජී. 52/48.

ඩී. එච්. ද එස්. ගුණවර්දන මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1959 මාර්තු 14 වැනි දින, රත්නපුරේ දිස්ත්‍රික් උසාවියේ අංක 475 නඩුව ඇහීමට හා 1959 මාර්තු 30 වැනි දින, රත්නපුරේ දිස්ත්‍රික් උසාවියේ අංක 731 නඩුව ඇහීමට, රත්නපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑස්සී. පීපී. 3/59.

එල්. එම්. පී. පී. විරසිංහ මහතා ලංකා අධිකරණ සේවයේ නිලධාරියකු වශයෙන් වැඩ බැලීමට හා අතිරික්ත නිලධාරියකු වශයෙන් හා 1959 මාර්තු 5 වැනි දින පටන්, නැවත නියමයක් කරන තුරු, අනුරාධපුරයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුරයේ අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා අතිරේක මහේස්ත්‍රාත් ධුරයට, මන්නාරමේ හා වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑස්සී. පීපී. 14/58.

ජේ. ජී. එල්. සුවාරිස් මහතා 1959 පෙබරවාරි 2 වැනි දින පටන්, නැවත නියමයක් කරන තුරු, හම්බන්තොට මහෙස්ත්‍රාත් ධුරයට හා රික්වැස්ට් කොමසාරිස් ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑස්සී. පීපී. 3/59.

ඒ. එම්. අමීන් මහතා ලංකා අධිකරණ සේවයේ නිලධාරියකු වශයෙන් වැඩ බැලීමට, හා පී. ඒ. ගුණරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, 1959 මාර්තු 5 වැනි දින පටන්, ගම්පහ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා ගම්පහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑල්. 48/48.

ඒ. එස්. පොන්නම්බලම් මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, පී. ඒ. ධර්මදාස මහතා 1959 මාර්තු 9 වැනි දින පටන්, රත්නපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, රත්නපුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය: ජේජී. 38/48.

එස්. ඉලෙයතම්බි මහතා 1959 මාර්තු 14 වැනි දින, මල්ලකම් මහෙස්ත්‍රාත් උසාවියේ අංක 4,001 නඩුවේ තීන්දුව දීමට, යාපනේ අතිරේක මහේස් ත්‍රාත් ධුරයට හා යාපනේ මල්ලකම් උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑල්. 7ඒ/51.

ජී. ඕ. එස්. දිසානායක මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සී. කනගසිංහම් මහතා 1959 මාර්තු 6 වැනි දින පටන් 10 වැනි දින දක්වා, ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, ත්‍රිකුණාමලයේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා අනුරාධපුරයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑල්. 6බී/48.

ඊ. බී. එස්. කොරෙයා මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එච්. ප්‍රනාන්දු මහතා 1959 මාර්තු 5 වැනි දින, කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, කෑගල්ලේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය: ජේඑල්. 1ඒ/48.

පී. එස්. ඩබ්ලිව්. අබේවර්දන මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඕ. එම්. එල්. පින්ටු මහතා 1959 මාර්තු 5 වැනි හා 6 වැනි දිනයන්හි, රත්නපුරේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා රත්නපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේජී. 40/48.

බී. ආර්. ජී. විජෙයකෝන් මහතා 1959 මාර්තු 16 වැනි දින, මාතලේ මහේස්ත්‍රාත් උසාවියේ අංක 4,273 නඩුව ඇහීමට, මාතලේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා මහනුවර, මාතලේ උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑල්. 45/48.

වී. ටී. පණ්ඩිත ගුණවර්දන මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. ඒ. සී. සිරිසේන මහතා 1959 මාර්තු 13 වැනි දින, බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, බලපිටියේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය: ජේඑල්. 1සී/53.

එම්. එම්. අබ්දුල් කාදර් මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සේනානායක මහතා 1959 මාර්තු 6 වැනි දින පටන්, ගම්පහ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා ගම්පහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑල්. 67ඒ/58.

ඩබ්ලිව්. ඩී. තාමෝදරම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. ඒ. සී. සිරිසේන මහතා 1959 මාර්තු 9 වැනි දින පටන් 12 වැනි දින දක්වා, බලපිටියේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට, හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේ.එල්. 34ඒ/48.

එස්. එස්. කුලතිලක මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. වී. එස්. ද සිල්වා මහතා 1959 මාර්තු 11 වැනි දින, කුරුණෑගල අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා කුරුණෑගල, කනදූල්ල උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේජී. 20/48.

ඒ. සේනානායක මහතා 1959 මාර්තු 13 වැනි දින, ගම්පහ මහේස්ත්‍රාත් උසාවියේ අංක 44,780/ඒ; 47,394/ඒ; 47,488/ඒ; 47,618/ඒ; 47,182/ඒ හා 47,982/ඒ නඩුවල තීන්දු දීමට, ගම්පහ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා ගම්පහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: පීඑල්/සී.7/56.

එම්. එම්. පෙරේරා මහතා නැති අතර, ටී. වරුසවිතාරන මහතා 1959 මාර්තු 6 වැනි දින, මහනුවර දිස්ත්‍රික්කයේ, දකුණු හා නැගෙනහිර මාතලේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය: පීඑල්/ඊ.1/48.

එම්. එහෙම්පර නාදන් මහතා නැති අතර, එන්. එස්. සිවප්‍රගාසම් මහතා 1959 මාර්තු 9 වැනි දින, මඩකලපු දිස්ත්‍රික්කයේ, අක්කරෙයි හා පනමා පත්තු ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

එස්. ආර්. විජෙයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1959 මාර්තු 10 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කායර්‍යාලය,
තැ. පෙ. අංකය. 573,
කොළඹ 12.

# වෙනත් පත් කිරීම්

**1959 අංක 116**

අංකය : ඒ.අයි.15/3/52.

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 16 වෙනි පරිච්ඡේදයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

1958 දෙසැම්බර් මස 23 වෙනි දින සිට 31 වෙනි දින දක්වා පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටිය කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි ධුරයෙහි වැඩබැලූ කාලය තුළ එම කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් ලක්දස් ගුණවර්ධන මහතාද,

1959 මාර්තු මස 2 වෙනි දින සිට, එන්. පී. ද ඉසෙඩ්. ජයතිලක මහතා නැවත වැඩ භාරගන්නා තුරු, ගාල්ල දිස්ත්‍රික්කයේ කොස්ගොඩ ගම්සභා කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට කේ. ඒ. ද එස්. ආර්. විජේසිංහ මහතාද,

1959 මාර්තු මස 3 වෙනි දින සිට, කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අලුත්කුරු කෝරලේ සහ බස්නාහිර සියනෑකෝරලේ අධිකාරිපත්තුවේ අංක 251, 253, 255 සිට 267, 277 සහ 278 යන ගම්මුලාදෑනි කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුරයට ආර්. පී. ඩී. යසවර්ධන මහතාද,

1959 මාර්තු මස 4 වෙනි දින සිට, එල්. පී. ඊ. කරුණාරත්න මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මීගමු නගර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ක්‍රිස්ටි ද ක්‍රෲස් මහතාද,

1959 මාර්තු මස 6 වෙනි දින සිට, එල්. එච්. අන්දිරිස් සිල්වා මහතා නැවත වැඩ භාරගන්නාතුරු, බදුල්ල දිස්ත්‍රික්කයේ ඔය පලාත කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට පී. ඒ. වනසිංහ මහතාද,

1959 මාර්තු මස 10 වෙනි දින සිට, එස්. එස්. රාසතුරෙයි මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මන්නාරම් දිස්ත්‍රික්කයේ උතුරු මාන්තෙයි කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඇන්තනි පරුනාන්දු මහතාද,

1959 මාර්තු මස 13 වෙනි දින සිට, අනුරාධපුර දිස්ත්‍රික්කයේ උලගල්ල කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරයට එස්. එම්. ඖෂධහාමු මහතාද,

1959 මාර්තු මස 14 වෙනි දින සිට, එක්ස්. එම්. සෙල්ලතම්බු මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ ඉරවූර් පත්තුවේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි ධුරයෙහි වැඩබලන කාලය තුළ එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඒ. කන්දයියා මහතාද,

1959 මාර්තු මස 16 වෙනි දින සිට, ඩබ්ලිව්. එම්. ඒ. විජේරත්න බණ්ඩා මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ වැව්ගම් පත්තුවේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි ධුරයෙහි වැඩබලන කාලය තුළ එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට එච්. ඇම්. සභානායක මහතාද,

1959 මාර්තු මස 16 වෙනි දින සිට, සී. අලෙක්ස්සැන්ඩර් මහතා නැවත වැඩ භාරගන්නාතුරු, මන්නාරම් දිස්ත්‍රික්කයේ කොදෙව් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ආර්. එස්. ලාසරස් මහතාද,

1959 මාර්තු මස 21 වෙනි දින සිට, ආර්. බී. රණතුංග මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ බින්තැන්න කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි ධුරයෙහි වැඩබලන කාලය තුළ එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට එක්ස්. එම්. සෙල්ලතම්බු මහතාද,

පත්කර ඇත්තේය.

ජී. සී. ටී. ඒ. ද සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1959 මාර්තු මස 17 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

---

# ආණ්ඩුවේ නිවේදන

**1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනත**

ආඥාව

1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 වෙනි වගන්තියේ (1) හා (8) වෙනි උප වගන්තිවලින් හා 4 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පරිදි, අධිකරණ අමාත්‍ය මානික්කු වඩුමේස්ත්‍රි හෙන්ද්‍රික් ද සිල්වා වන මම, මෙයින්—

(අ) පහත සඳහන් තැනැත්තන් කළුතර දිස්ත්‍රික්කයේ මහපත්තු ගම් ප්‍රදේශය සඳහා සමන්විත සමගි මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් පත්කරමි.

(1) පැනිගල පදිංචි, ගරු පැනිගල මෙත්තානන්ද ස්ථවිරයන් වහන්සේ.
(2) අගලවත්තේ, කෙලින් කන්ද පදිංචි, ගරු මීරිගම පියදස්සි ස්ථවිරයන්වහන්සේ.
(3) බදුරලියේ පදිංචි, දොන් ජාරලිස් ගලබඩ.
(4) කිතුල්ගොඩ පදිංචි, ගමගේ දොන් යසපාල.
(5) කෙච්චියාගල පදිංචි, දොන් මාටින් සමරසිංහ.
(6) මොරගල පදිංචි හපුආරච්චිගේ ආර්නෝල්ඩ් පෙරේරා ධර්මවර්ධන.
(7) පිඹුර පදිංචි, දොන් ජෝන් විජේගුණවර්ධන.
(8) බෙල්ලන පදිංචි, චාල්ස් බෙන්ජමින් සමරදිවාකර අබේගුණසේකර තිලකරත්න.
(9) අගලවත්ත පදිංචි, වලාකුළු ආරච්චිගේ දොන් මෝසස් ද සිල්වා ගුණතිලක.
(10) අගලවත්ත පදිංචි, රෙක්ස් ජෝන් මෙරී අබේකෝන්.
(11) ඉහල හේවැස්ස පදිංචි, වලාකුළු ආරච්චිගේ දොන් ජිඩින් අප්පුහාමි.
(12) පැලවත්ත පදිංචි, හෙට්ටිආරච්චිගේ දොන් සීමන් අත්ථදස්සි.
(13) මීගහතැන්න පදිංචි, පල්ලෙකන්කානන්ගේ දොන් වෝල්ටර් විජේගුණවර්ධන.
(14) මොරගල පදිංචි සෙම්බුකුට්ටි විදනලාගේ සිස්කෝ අප්පු ද සිල්වා.
(15) රත්මලේ පදිංචි, මද්දෙගම ආරච්චිගේ දොන් සීමන් කුලරත්න
(16) කුරුපිට පදිංචි, බටුකන්දගේ හෙන්ද්‍රික් සමරනායක.
(17) පිඹුර පදිංචි, දයාරත්න සමරසේකර.
(18) කෙච්චියගල පදිංචි, බෙන්ජමින් ඩයනීෂියස් විජේතිලක.
(19) උඩවෙල පදිංචි දෙමින් ආච්චි අතුකෝරලලාගේ ඇලන්.
(20) ඕමත්ත පදිංචි, පහලවත්ත ආරච්චිගේ පියරත්න.
(21) වඳුරඹ පදිංචි, ජයලත් ආරච්චිගේ ලයනල් ඩයනීෂියස් සෙනෙවිරත්න.
(22) පින්නගොඩ පදිංචි, පින්නගොඩ විතානගේ බුද්ධදාස සේනානායක.
(23) යකුපිටිය පදිංචි, කොහිලමුල්ල ආරච්චිගේ බාරොන් අප්පුහාමි.
(24) ලත්පඳුර පදිංචි, දොන් ඩයස් වීරක්කොඩි වෛද්‍යතිලක දිසානායක.
(25) කෙලින් කන්ද පදිංචි බුලත්සිංහලගෙ දොන් ලිවේරිස් සිංඤෝ.
(26) කුඩා අබේගොඩ පදිංචි, රණසිංහ ආරච්චිගේ දොන් චාර්ලිස් අප්පුහාමි.
(27) පැනිගල පදිංචි, ගිකියනගේ පීරිස් සිල්වා.
(28) ගුරුලුබැද්ද පදිංචි, දොන් ඩයස් රණතුංග අප්පුහාමි.

(ආ) ඉහතකී මණ්ඩලයේ සභාපති වශයෙන් බදුරලිය පදිංචි දොන් ජාරලිස් ගලබඩ මහතා පත්කරමි, තවද,

(ඇ) එබඳු එක් එක් සාමාජිකයා නිලය දැරිය යුතු කාල සීමාව, මේ ආඥාව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දින සිට අවුරුදු 2ක් විය යුතුයයි නිශ්චය කරමි.

ඇම්. ඩබ්ලිව්. එච්. ද සිල්වා,
අධිකරණ අමාත්‍ය.

1959 මාර්තු 16 දින,
කොළඹ.

---

**1958 අංක 1 දරණ කුඹුරු පනත**

56 වෙනි වගන්තිය යටතේ දැනුම්දීමයි

1958 අංක 1 දරණ කුඹුරු පනතේ 56 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව ගොවිකම් හා ආහාර ඇමති තැන්පත් දොන් පිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම, පහත උපලේඛනයේ සඳහන් කුඹුරු ගොවි සමිතියක් සඳහා අත්පත් කර ගැනීම අවශ්‍ය යයි සහතික කරමි.

ඩී. පී. ආර්. ගුණවර්ධන,
ගොවිකම් හා ආහාර ඇමති.

1959 පෙබරවාරි මස 28 වන දින,
කොළඹ දී ය.

### උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාගම්පත්තුවේ ආදයම් නිලධාරි තැනගේ ප්‍රදේශයේ දකුණු රණකෙලිය ගම්මුලාදෑනි තැනගේ කොට්ඨාශයේ වැලිපොටවෙල ගමේ වැලිපොටවෙල වත්තේ කොටසක්වූ අක්කර 42යි, රූඩ් 2ක විශාලත්වය ඇති පහත සඳහන් කුඹුරු සහ එම කුඹුරු වලට යාබද වූ ද, අයිති වූ ද, ඉඩම් ඇතුළත් වූ ඉඩම. ඊට මායිම් :—

උතුරට : පේරගහ කුඹුර යන කුඹුර ද ;

නැගෙනහිරට : බණ්ඩාර ඇල ද ;

දකුණට : සූරිය ඉඩම නමැති ඉඩම ද ;

බස්නාහිරට : පරණ මාගම් ඇල ද.

(1) හම්බුව සහ පට්ටියකුඹුර.
(2) කෙහෙල්වත්ත කුඹුර.
(3) හතලිහ කුඹුර.
(4) මහවෙල මලෙත්තම.
(5) පළගහ කුඹුර.
(6) අටෙන්පත්ගුව.

---

### 1958 අංක 1 දරණ කුඹුරු පනත

#### 56 වෙනි වගන්තිය යටතේ දැනුම්දීමයි

1958 අංක 1 දරණ කුඹුරු පනතේ 56 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව ගොවිකම් හා ආහාර ඇමති තැන්පත් දෙන් පිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම, පහත උපලේඛනයේ සඳහන් කුඹුර ගොවි සමිතියක් සඳහා අත්පත් කර ගැනීම අවශ්‍ය යයි සහතික කරමි.

ඩී. පී. ආර්. ගුණවර්ධන,
ගොවිකම් හා ආහාර ඇමති.

1959 පෙබරවාරි මස 28 වන දින,
කොළඹ දී ය.

### උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ නැගෙනහිර ගිරුවාපත්තුවේ ආදයම් නිලධාරි තැනගේ ප්‍රදේශයේ හකුරුවෙල ගම්මුලාදෑනි තැනගේ කොට්ඨාශයේ පිහිටා තිබෙන අක්කර 10යි, රූඩ් 3යි, පර්චස් 31ක විශාලත්වය ඇති, හවන නමැති කුඹුර සහ එම කුඹුරට යාබද වූද, ඊට අයිති වූ ද, ඉඩම් ඇතුළත් වූ ඉඩම. ඊට මායිම් :—

උතුරට : පලු ඇල ;

නැගෙනහිරට : ඇතුළත්කැල්ල ඉමනියර සහ තලදීගනේ ඉමනියර ;

දකුණට : වාරිමාර්ග ඇල ;

බස්නාහිරට : ඇල.

---

### 1958 අංක 1 දරන කුඹුරු පනත

#### 56 වෙනි වගන්තිය යටතේ දැනුම් දීමයි

1958 අංක 1 දරණ කුඹුරු පනතේ 56 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව ගොවිකම් හා ආහාර ඇමති තැන්පත් දෙන් පිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම, පහත උපලේඛනයේ සඳහන් කුඹුර ගොවි සමිතියක් සඳහා අත්පත් කර ගැනීම අවශ්‍ය යයි සහතික කරමි.

ඩී. පී. ආර්. ගුණවර්ධන,
ගොවිකම් හා ආහාර ඇමති.

1959 පෙබරවාරි මස 28 වන දින,
කොළඹදීය.

### උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ නැගෙනහිර ගිරුවාපත්තු ආදයම් නිලධාරි තැනගේ ප්‍රදේශයේ හකුරුවැල්ල ගම්මුලාදෑනි තැනගේ කොට්ඨාශයේ පිහිටා තිබෙන, අක්කර 17යි, පර්චස් 5ක විශාලත්වය ඇති, මෝදරමොටවිල නමැති කුඹුර සහ එම කුඹුරට යාබද වූ ද, ඊට අයිති වූ ද, ඉඩම් ඇතුළත් වූ ඉඩම. ඊට මායිම් :—

උතුරට : ආර්. බී. 1 දරණ වාරිමාර්ග ඇල ;

නැගෙනහිරට : ආර්. බී. 1 දරණ වාරිමාර්ග ඇල ;

දකුණට : පන්සල ඉඩම ;

බස්නාහිරට : කරව්ගස්වෙල ඉන්නියර සහ දික්මුලාන.

### 1958 අංක 1 දරණ කුඹුරු පනත

#### 56 වෙනි වගන්තිය යටතේ දැනුම් දීමයි

1958 අංක 1 දරණ කුඹුරු පනතේ 56 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව ගොවිකම් හා ආහාර ඇමති තැන්පත් දෙන් පිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම, පහත උපලේඛනයේ සඳහන් කුඹුර ගොවි සමිතියක් සඳහා අත්පත් කර ගැනීම අවශ්‍ය යයි සහතික කරමි.

ඩී. පී. ආර්. ගුණවර්ධන,
ගොවිකම් හා ආහාර ඇමති.

1959 පෙබරවාරි මස 28 වන දින,
කොළඹදීය.

### උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ නැගෙනහිර ගිරුවාපත්තු ආදයම් නිලධාරි තැනගේ ප්‍රදේශයේ හකුරුවැල්ල ගම්මුලාදෑනි තැනගේ කොට්ඨාශයේ පිහිටා තිබෙන අක්කර 6යි, පර්චස් 14 ක විශාලත්වය ඇති, පල්ලෙපත් ගමුව නමැති කුඹුර සහ එම කුඹුරට යාබද වූ ද, ඊට අයිති වූ ද, ඉඩම් ඇතුළත් වූ ඉඩම. ඊට මායිම් :—

උතුරට : හුනගෙවත්ත ;

නැගෙනහිරට : බදිගමගේ මූලන ඉමනියර ;

දකුණට : ඉහල වරමුන ඉමනියර සහ පහල වරමුන ඉමනියර ;

බස්නාහිරට : බද්දිවෙල ඉමනියර.

---

### 1958 අංක 1 දරණ කුඹුරු පනත

#### 56 වෙනි වගන්තිය යටතේ දැනුම් දීමයි

1958 අංක 1 දරණ කුඹුරු පනතේ 56 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව ගොවිකම් හා ආහාර ඇමති තැන්පත් දෙන් පිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම, පහත උපලේඛනයේ සඳහන් කුඹුර ගොවි සමිතියක් සඳහා අත්පත් කර ගැනීම අවශ්‍ය යයි සහතික කරමි.

ඩී. පී. ආර්. ගුණවර්ධන,
ගොවිකම් හා ආහාර ඇමති.

1959 පෙබරවාරි මස 28 වන දින,
කොළඹදී ය.

### උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාගම්පත්තුවේ ආදයම් නිලධාරි තැනගේ ප්‍රදේශයේ දකුණු රණකෙලි ගම්මුලාදෑනි තැනගේ කොට්ඨාශයේ වැලිපොටවෙල ගමේ වැලිපොටවෙල වත්තේ කොටසක් වූ අක්කර 17 ක විශාලත්වය ඇති පහත සඳහන් කුඹුරු සහ එම කුඹුරු වලට යාබද වූ ද, අයිති වූ ද, ඉඩම් ඇතුළත් වූ ඉඩම. ඊට මායිම් :—

උතුරට : පතන අමුණුහතර යන කුඹුරු ද ;

නැගෙනහිරට : පරණ මාගම ඇල ද ;

දකුණට : උසුප් ඉඩම යන ඉඩම ද ;

බස්නාහිරට : වැලිපොතවෙල පාර.

(1) පතන අළුත් කෙල්ල.
(2) පතන උතුරු කෙල්ල.
(3) පතන අමුණුදෙක.

---

### 1958 අංක 1 දරණ කුඹුරු පනත

#### 56 වෙනි වගන්තිය යටතේ දැනුම් දීමයි

1958 අංක 1 දරණ කුඹුරු පනතේ 56 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව ගොවිකම් හා ආහාර ඇමති තැන්පත් දෙන් පිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම, පහත උපලේඛනයේ සඳහන් කුඹුර ගොවි සමිතියක් සඳහා අත්පත් කර ගැනීම අවශ්‍ය යයි සහතික කරමි.

ඩී. පී. ආර්. ගුණවර්ධන,
ගොවිකම් හා ආහාර ඇමති.

1959 පෙබරවාරි මස 28 වන දින,
කොළඹදී ය.

## උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාගම්පත්තුවේ ආදායම් නිලධාරී තැනගේ ප්‍රදේශයේ දකුණු රණකෙලි ගම්මුලාදෑනි තැනගේ කොට්ඨාශයේ වැලි පොටවෙල ගමේ වැලිපොටවෙල වත්තේ කොටසක් වූ අක්කර 40 ක විශාලත්වය ඇති පහත සඳහන් කුඹුරු සහ එම කුඹුරු වලට යාබද වූ ද, අයිති වූ ද, ඉඩම් ඇතුළත් වූ ඉඩම. ඊට මායිම් :—

උතුරට : පෙරගහ කුඹුර යන කුඹුරද ;

නැගෙනහිරට : පරණ මාගම් ඇලද ;

දකුණට : අන්දරගස්යායට යන ගම්සභා පාරද ;

බස්නාහිරට : ගම්සභා පාර සහ එලියන් ඉඩම.

(1) ගොඩකුඹුර සහ තෝමිස් අමුණ.

(2) පොටව.

(3) ගොඩඅමුණුදෙක සහ ආරච්චි අමුණ.

(4) අට්ටික්කගහ කුඹුර.

(5) පතන අමුණුහතර.

---

කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් ජෝන් ස්ටැන්ලි පෙරේරා මහතා විසින් නොතාරිස් ආඥාපනතේ (91 වන පරිච්ඡෙදයේ) 21 (1) වගන්තිය යටතේ 1959 ජනවාරි මස 25 වැනි දින සිට නොතාරිස් ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලියකියවිලි ඉදිරිපත් කරන ලදුව, ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් එකී දින සිට එම ඉල්ලා අස්වීම භාරගෙන තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1959 පෙබරවාරි මස 28 වැනි දින,
කොළඹ දීය.

---

1952කේ නො. 12 දරණ සෞඛ්‍ය සේවා පනතෙහි 11 වෙනි වගන්තිය යටතේ, 1959 මාර්තු මස 10 වෙනි දින පටන්, දොස්තර එස්. තිරුනාවුකරසු මහතා ගාල්ලේ ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිවරිය විසින් පත්කරනු ලැබී ය.

වී. ජේ. ඇ. වැන්ලැන්ගන්බර්ග්,
ස්ථාවර ලේකම්.

1959 මාර්තු මස 10 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය, කොළඹ.

---

## ඡන්ද කොට්ඨාශ බෙදා වෙන්කිරීමේ කොමිෂන් සභාව

කල් ඉල්ලමින් එවා ඇති ඉල්ලීම් රාශිය නිසා, පුද්ගලයන් හා සමිති සමාගම් වලින් ඉදිරිපත් කෙරෙන කරුණු සැලකර සිටීම් හා යෝජනා භාර ගැනීමේ අවසාන දිනය 1959 අප්‍රෙල් මස 9 වැනි දින දක්වා දීර්ඝ කර ඇත.

2. සංදේශ හා ඊට අදාල සංඛ්‍යා සටහන් හැකිතාක් ඉක්මනින් ඉදිරිපත් කරන්නේ නම්, එය අගය කොට සලකනු ලැබේ.

මෙයට,

අණ පරිදි,

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
ඡන්ද කොට්ඨාශ බෙදා වෙන් කිරීමේ
කොමිෂන් සභාවේ ලේකම්.

1957.3.17 වැනි දින,
ඡන්ද කොට්ඨාශ බෙදා වෙන්කිරීමේ
කොමිෂන් සභා කාර්යාලය,
නගර ශාලාව, කොළඹ.

---

## 4 බී පෝර්මය

## 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පනත

### පනතේ දහවැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ වැඩබලන කොමසාරිස් තැන්පත් වික්ටර් ජෝශප් හැරල්ඩ් ගුණසේකර වන මා, 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පනතේ දහවැනි වගන්තිය යටතේ දැනුම් දී සිටින්නේ පහත සඳහන් උපලෙඛනයේ දක්වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම එකී පනතේ 4 වැනි වගන්තියේ 1 වැනි සහ 2 වැනි උප වගන්ති යටතේ අනුමතකිරීමට යම්කිසි මහජනයෙකුගේ විරුද්ධතාවයක් ඇත්නම් කුමන කාරණ නිසා එවැනි විරුද්ධතාවය මුල්කරගනු ලැබීද යනු සඳහන් ලිපියක් මෙම දැන්වීම ප්‍රසිද්ධ කළ දින සිට මසක් තුළදී නොලැබුනි නම් ඒ සෑම ඉල්ලුම් පත්‍රයක්ම අනුමතකරන බවයි.

විරුද්ධවන සෑම අයෙකුගේ ම සම්පූර්ණ නම් සහ ලියුම් ලැබෙන පිළිවෙල සෑම විරුද්ධවීමේ නිවේදනයකම ඇතුළත්විය යුතුයි.

වී. ජේ. එච්. ගුණසේකර,
ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ
වැඩබලන කොමසාරිස්තැන.

1959 මාර්තු මස 17 වෙනි දින,
කොළඹ.

### උපලෙඛනය

| ඉල්ලුම්පත්‍රයෙහි නො. සහ දිනය | | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචිකිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචිකිරීමට ඉල්ලුම්කරන අයගේ නමත් සමග ලියාපදිංචිකිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|---|---|
| L 2213—11.3.51 | ... | මුදියප්පන් වේදමුත්තු, සමර්සෙට් වත්ත, උඩහේන්තැන්න, ගම්පොල | | සන්දනමරියාල් (භාර්යාව), පාකියම් (දුව) |
| KD 463/L—27.7.50 | ... | පොන්නම්බලම්පිල්ලෙයි, මුරුගයියාපිල්ලෙයි, මුරුගොල්ල වත්ත පුස්සැල්ලාව | | තයිලම්මා (භාර්යාව) |
| M 10449—21.7.51 | ... | අයියකන්නු වේළු, කන්දෙනුවර වත්ත, මාතලේ | ... | සෝරනම් (භාර්යාව), රාමු නොහොත් ආරුමුගම් (පුතා), තිලගවති නොහොත් සිදේවිඅම්මා (දුව), සන්දනම් (පුතා), සෙල්ලදෙරෙයි (පුතා) |
| M 11292—25.7.51 | ... | පොන්නලගු ගේ වැන්දඹුවවූ අලගන් පිච්චායි, ස්ට්‍රැතිස්ල වත්ත, අල්වත්ත, මාතලේ | | කරුමලයන් (පුතා), පොන්නම්මා (දුව), අඩෙක්කම්මා නොහොත් වෙල්ලයම්මාල් (දුව) |
| N 1971—26.8.50 | ... | මුත්තුසාමි පලනියාණ්ඩි, ඉහළ කොටස, උතුරු පුන්දූල්ඔය වත්ත, පුන්දූල්ඔය | | සිට්ටාල් (භාර්යාව), කරුප්පායි නොහොත් ලෙච්චුමි (දුව), වේළු (පුතා), වීරම්මා නොහොත් පොන්නම්මා (දුව), ආරුමුගම් (පුතා), වේලායි (දුව), මාරිමුත්තු (පුතා) |
| N 2025—25.8.50 | ... | කරුප්පයියා කරුප්පන්, පහළ කොටස, උතුරු පුන්දූල්ඔය වත්ත, පුන්දූල්ඔය | | තයිඅම්මාල් (භාර්යාව), පේච්චිඅම්මාල් (දුව), වල්ලි (දුව), වීරම්මා (දුව), තනලෙච්චුමි (දුව) |
| N 2408—30.8.50 | ... | මූක්කන් අලගන්, කයිපුගල්ල වත්ත, පුන්දූල්ඔය | ... | සින්නම්මාල් (භාර්යාව), රාමලිංගම් (පුතා), සෙල්ලායි (දුව) |

| ඉල්ලුම්පත්‍රයෙහි අංකය සහ දිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලුම්කරන අයගේ නමත් සමග ලියාපදිංචි කිරීමට අයැද සිටින අනාථ අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|
| O 9306—25.7.51 ... | සෝලමලෙයි මලයන්ඩිගේ වැන්දඹුවවූ කුන්වාරම්, මහළුව වත්ත, හරස්බැද්ද | මානික්කම් නොහොත් මනික්කි (දුව), අමරාවති (දුව), සෙල්ලම් (දුව), පූර්නම් නොහොත් ජයපූර්නම් (දුව), කදිර්මලෙයි නොහොත් කදිර්මල (පුතා) |
| Q 10346—8.7.51 ... | මෙයියප්පන් ආවාදෙයි, සාන්ත ලෙනාඩ් වත්ත, හල්ග්‍රන්ඔය | මරියායි නොහොත් මීනාච්චි (භාර්‍යාව), වීරායි (දුව), සෙල්ලම්මා (දුව), වේලයුදම් (පුතා), පෙරුමාල් (පුතා), කමලායි නොහොත් පලනියායි (දුව), මුරුගයියා (පුතා), කනගරත්නම් (පුතා) |
| Q 5528—18.5.51 ... | කරුප්පයියා රාමසාමි, රත්නිල්ලකැලේ කොටස, හෝලිරූඩ් වත්ත, තලවකැලේ | සෙල්ලම්මාල් (භාර්‍යාව), ගාන්දිමතිඅම්මාල් (දුව), ජයමනි (දුව), සෙල්වරානි (දුව) |
| K 8672/N/R—24.6.51 ... | ධර්මයියා පෙරුමාල්, ඇවෝකා කොටස, ක්ලැරෙන්ඩන් වත්ත, නානුඔය | පද්මාවති (භාර්‍යාව), රාමචන්ද්‍රන් (පුතා) |
| O 11/V—3.9.50 ... | යේසුදියන් ආතර් ජෙබඥනම්, මහදෝව වතුයාය, මඩුල්සීම | ග්‍රේස් පොන්නුතායි (භාර්‍යාව), රවින්ද්‍රනාත් ජුලියන් (පුතා) |
| Y 3503—23.6.51 ... | ආන්දයප්පන් නොහොත් සියන්පිල්ලෙයිගේ පුතා සුප්පයියා, පැක්ටෙරිය, කුල්ලන්වත්ත, බදුල්ල | සින්නම්මාල් (භාර්‍යාව), නල්ලතම්බි (පුතා), කරුප්පායි (දුව), වීරම්මා (දුව), කරුප්පයියා (පුතා), විසාලාච්චි (දුව), විජයලක්ෂ්මි (දුව), වේළුසාමි (පුතා), තනපාකියම් (දුව) |
| BB 2113—20.5.51 ... | සිට්ටු පෙරුමාල්, ඇකරැල්ල වත්ත, ඔපනායක ... | සෝලාච්චි (භාර්‍යාව) |
| M 5402/O—15.6.51 ... | සෙල්ලපෙරුමාල් පිල්ලෙයි මාරිමුත්තු, අංක 3 කොටස, රුක්වුඩ් වත්ත, හේවාහැට | අන්ගම්මා (භාර්‍යාව), අර්පුදරානි නොහොත් අලගම්මා (දුව), මූලන්ගිඅම්මාල් (දුව), සසිකලදේවි (දුව), බාලකුමාර් (පුතා) |
| P 1233—29.9.50 ... | වයියාපුරි වීරයියා නොහොත් වීරන්, ෆෙයාර්ෆිල්ඩ් කොටස, මවුන්ට් වර්නන් වත්ත, කොටගල | සෙල්ලම්මාල් (භාර්‍යාව), කන්නිඅම්මා නොහොත් සරස්වති (දුව), සිවපාකියම් නොහොත් තනම් (දුව), නඩරාජ් (පුතා), කමළම් (දුව), ලෙච්චුමි (දුව), පාර්වති (දුව), මූර්ති (පුතා) |
| P 4057—27.11.50 ... | අම්මදසි වේළු, තෝන්ෆීල්ඩ් වත්ත, අග්‍රපතන ... | නල්ලම්මා (භාර්‍යාව) |
| P 4270—30.11.50 ... | පෙරුමාල් තන්ගාලන්, මහා ඩරේටන් වත්ත, කොටගල ... | පාතම්මාල් (භාර්‍යාව), ගෙන්වීරන් (පුතා), වල්ලිඅම්මා (දුව) |
| P 5607—30.11.50 ... | අන්නමලෙයි රාමසාමි, 1 වෙනි කොටස, බටහිර දියගම වත්ත අග්‍රපතන | උන්නමලෙයි (භාර්‍යාව), වල්ලිඅම්මා (දුව), සුබ්‍රමානියම් (පුතා), ආරුමුගම් (පුතා) |
| P 5690—1.2.51 ... | කාලිමුත්තු මුක්කයියා, අංක 2, **පත**න බසාර්, කොටගල | රාමායි (භාර්‍යාව), රාජමානික්කම් (දුව), බාලරාජු (පුතා) |
| P 6162—17.2.51 ... | රාමසාමි දුරෙයිසාමි, ක්ලයිඩ්ස්ඩේල් වත්ත, අග්‍රපතන ... | අලමේල් (භාර්‍යාව), රාමසාමි නොහොත් රාසු (පුතා), වීරසාමි (පුතා), නල්ලුසාමි නොහොත් ගෝපාල් (පුතා) |
| P 6336—17.2.51 ... | රාමන් වීරන්, බැල්මෝරල් වත්ත, අග්‍රපතන ... | සින්නම්මාල් (භාර්‍යාව), රාමායි (දුව), රාජම්බාල් (දුව), රාමනාදන් (පුතා) |
| U 1568—15.7.51 ... | පෙරියතම්බි නඩේසන්, මුවන්කන්ද වත්ත, මාවතගම ... | පොන්නම්මාල් (භාර්‍යාව), පෙරියතම්බි (පුතා), සිදම්බරම් (පුතා), මුනිඅම්මාල් (දුව), ආරුමුගම් (පුතා), පද්මනාදන් (පුතා) |
| W 112—17.12.50 ... | අයියසාමි මුත්තයියා රාමයියා, බටවත්ත වත්ත, මඩුල්සීම | මනෝන්මනි (භාර්‍යාව), රත්නේස්වරි (දුව), පුවනේස්වරි (දුව), යෝගේස්වරි (දුව), සුන්දරේස්වරි (දුව), මෝහනේස්වරි (දුව) |
| V 8094/W—2.8.51 ... | ආන්ඩියප්පන් තන්ගවේළු, ජී. බී. අමාරියස් සිල්වා සහ සමාගම බාරේ, නමුනුකුල | ලෙච්චිමිතායි (භාර්‍යාව), රාමලිංගම් නොහොත් රාමචන්ද්‍රන් (පුතා), කදිරවේල් නොහොත් තියාගරාජා (පුතා), සිතිරමනි (දුව), ජෙයපාකියම් (දුව), තර්මලිංගම් (පුතා) |
| O 7463/X—8.7.51 ... | පෙරියතම්බි මුත්තයියා, කෝන්දගොල්ල කොටස, වල්ඩෙමාර් වතුයාය, උඩපුස්සැල්ලාව | මාරියායි (භාර්‍යාව), මාරිමුත්තු (පුතා), කරුප්පයියා (පුතා), ෂන්මුගම් (පුතා) |
| Q 6884—15.7.51 ... | පාකියම් සින්නප්පන්, ඇන්ෆිල්ඩ් වත්ත, ලිදුල ... | මරියකන්නු (භාර්‍යාව), ප්‍රගාසම් නොහොත් ප්‍රගාසම්මාල් (දුව), පීටර් (පුතා), මේරි (දුව), රාජු (පුතා), තෙරේසම්මා (දුව), පිලෝමිනා (දුව), ඥනපිරගාසම් නොහොත් ගේබ්‍රියල් (පුතා), පොන්නුදුරෙයි (පුතා) |
| Q 8044—28.7.51 ... | නල්ලු නල්ලු යොක්ස්ෆෝඩ් වත්ත, තලවකැලේ ... | ආන්ඩිච්චි (භාර්‍යාව), කදිරායි (දුව), වල්ලිඅම්මා (දුව) |
| Q 8311—3.8.51 ... | වෙල්ලසාමි කාලිමුත්තු, යොක්ස්ෆෝඩ් වත්ත, තලවකැලේ | සෙවනායි (භාර්‍යාව), මුක්කායි (දුව), රාජේස්වරි (දුව) |
| AA 682/Q—24.2.51 ... | සන්මුගම් කන්නුසාමි, ලිදුල වත්ත, තලවකැලේ ... | සාරතම්බාල් (භාර්‍යාව), රාමසාමි නොහොත් යෝගනාදන් (පුතා), යෝගරාජන් (පුතා) |

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## බල කඩදාසිය (හඳුනා ගැනීමේ පත්‍රය) නැතිවීම

**සී. ටී. රාසරත්නම් මහතා**

කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරියකු වූ, සී. ටී. රාසරත්නම් මහතාට දෙනලද මෙහි පහත දක්වෙන ආකෘතියෙන් යුත් බල කඩදාසිය (හඳුනා ගැනීමේ පත්‍රය) 1958 ජූලි මස 25 වන දින බොරැල්ලේ දී නැතිවූ ත්‍යෙයි වාර්තා කර තිබෙන බව මහජනයාගේ දැන ගැනීම පිණිස මෙයින් නිවේදනය කරනු ලැබේ. යම් කෙනකුට එය ඉදිරිපත් කරනු ලැබුවහොත් වහාම මට හෝ ළඟම පිහිටි පොලිස් ස්ථානයට හෝ එය දනුම් දිය යුතුය.

සී. බී. කුමාරසිංහ,
කම්කරු කොමසාරිස්වරයා.

1959 මාර්තු මස 12 වන දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ.

### ඉහත සඳහන් කළ ආකෘතිය

මෙහි පහත පෙනෙන ආදර්ශ අත්සන පරිදි අත්සන් තබන්නාවූ ද ඉදිරිපිට පිටුවෙහි ඡායාරූපය ඇත්තාවූ ද සී. ටී. රාසරත්නම් මහතා කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරියෙකි.

(අ) ලංකා නීති සංග්‍රහයේ 111 සිට 114 දක්වාවූ පරිච්ඡෙද යටතේ වතුවලටද,

(ආ) 1939 අංක 32 දරන ආඥාපනත යටතේ වෙළඳ ශාලා, පතල්, කර්මාන්ත ශාලා සහ වතුවලටද,

(ඇ) 1954 අංක 19 දරන පනත යටතේ කවර වෙළඳ ශාලාවකට හෝ කාර්‍යාලයකට, හා

(ඇ) 1941 අංක 27 දරන ආඥාපනත යටතේ ඕනෑම වැඩ කරන ස්ථානයකටද,

පිවිසීමටත් එසේ පිවිස තමාට නියමකොට ඇති රාජකාරි ඉටු කිරීමටත් ඔහුට බලය පවරා තිබේ.

අත්සන් කළේ :
ඇම්. රාජනායගම්,
කම්කරු කොමසාරිස්වරයා.
දිනය : 1952 ජනවාරි 24 වන දින.

අත්සන් කළේ :
සී. ටී. රාසරත්නම්,
(ආදර්ශ අත්සන).

## 1946 අංක 32 දරණ වාරිමාර්ග පනත

රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති, ලයනල් බාක්‍රොෆ්ට් අබයරත්න වන මම, 1946යේ අංක 32 දරණ වාරිමාර්ග පනතේ අංක 15 (1) (ඒ) දරණ වගන්තියෙන් මට පැවරී ඇති බලය අනුව පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් යෝජනාව අනුමත කරන බව මෙයින් දනුම් දෙමි.

එල්. බී. අබයරත්න,
රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති.

1959 මාර්තු මස 6 වන දින,
රත්නපුර කච්චේරියේදිය.

### උපලේඛනය

" රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළයේ කොස්ගල අමුණ යටතේ වැඩ කළ හැකි කුඹුරුවල අයිතිකරුවන්ගේ මෙම රැස්වීම යටකී වාරිමාර්ග පනතේ 5 වන කොටස යටතේ සකස් කරනු ලැබුවාවූ එකී වාරි කර්මාන්තය මෙයින් අනුමත කෙරේ ."

---

## කුර සහ මුව රෝගය

උතුරු පළාතේ වවුනියා දිස්ත්‍රික්කයේ (අ) වැල්ලබඩ පත්තු ආදායම් නිලධාරි කොට්ඨාශයේ මුලතිවු ගම්මුලාදෑනි වසම තුළ විල්ලවානෙයි ගමද; (ආ) උතුරු වවුනියා ආදායම් නිලධාරි කොට්ඨාශයේ උද්දුසුද්දන් ගම්මුලාදෑනි වසමේ කච්ලමඩු ගමද; (ඇ) උතුරු වවුනියා ආදායම් නිලධාරි කොට්ඨාශයේ සම්පූර්ණ නැදුන්කර්ණි ගම්මුලාදෑනි වසමේ කුලච්සුද්දන් මරයි සිලුපෙයි සහ නැදුන්කර්ණි ගමද ; (ඇ) වැල්ලබඩ පත්තු ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඔඩ්ඩුසුද්දන් ගම්මුලාදෑනි වසම තුළ ඔඩ්ඩුසුද්දන් ගම යන මෙකී ගම්වල ගවයන් අතර " කුර සහ මුව " රෝගය පැතිරී යන බැව් 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥාපනතේ 327 වැනි පරිච්ඡෙදයේ 4 වැනි වගන්තියේ (1) වැනි අකුරු වගන්තිය යටතේ බෝවෙන රෝග ඇති පළාත් ලෙස මා විසින් (අ) වර්ෂ 1958 ක්වූ අගෝස්තු මස 22 වෙනි දින අංක 11,479 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේද, (ආ) වර්ෂ 1958ක්වූ ඔක්තෝබර් මස 17 වැනි දින අංක 11,555 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේද, (ඇ) වර්ෂ 1958 ක්වූ ඔක්තෝබර් මස 31 වැනි දින අංක 11,573 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේද, (ඇ) සහ (උ) වර්ෂ 1958 ක්වූ නොවැම්බර් මස 7 වැනි දින අංක 11,579 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රවල ප්‍රසිද්ධ කරන ලද දැන්වීම් අද දින සිට අවලංගු වන බැව් මෙයින් මහජනයා වෙත දන්වමි.

ආයුර්වේදය අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1959 ක්වූ මාර්තු මස 12 වැනි දින,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැනගේ කාර්යාලය,
පේරාදෙණිය.

## විශෙෂ නිවේදනයයි

1959 මාර්තු 27 වැනි සිකුරාද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1959 මාර්තු මාසයේ හතරවැනි සුමානයේ ගැසට් පත්‍රය, 1959 මාර්තු 26 වැනි බ්‍රහස්පතින්ද නිකුත් කරන බැවින්, එහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1959 මාර්තු 23 වැනි සඳුද පස්වරු 4ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1959 මාර්තු 10 වැනි දින,
කොළඹ, ආණ්ඩුවේ මුද්‍රණාලයේ දීය.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරණ ලදී